# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2005/12 - 2017 පෙබරවාරි මස 08 වැනි බදාදා - 2017.02.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, එකී පනතේ 139 වන වගන්තිය ප්‍රකාරව එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූවා වූ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වා ඇති (2016 නොවැම්බර් මස 03 වැනි දින අංක 1991/44 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන්වරට සංශෝධිත) 2006 නොවැම්බර් මස 03 වැනි දින අංක 1469/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමයේ උපලේඛනය එහි I වැනි තීරයේ "තොරතුරු තාක්ෂණ පීඨය" යන අයිතමයට හා ඊට අනුරූපවන්නා වූ උපලේඛනයේ II වැනි තීරයේ සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය සහ සටහන් එකතු කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

| " *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| ව්‍යාපාර පීඨය | 1. තීරණ විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. කර්මාන්ත කළමනාකරණ අධ්‍යයන අංශය |
| | 3. තාක්ෂණ කළමනාකරණ අධ්‍යයන අංශය.". |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 ජනවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

02 - 857


1A - PG 3401 — 508 (2017/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*